නිපුණතාව 12.0 - පුද්ගලයන්ගේ හා සංවිධානවල පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි.

නිපුණතා මට්ටම 12.9 – මෙහෙයවීමේ ක්‍රියාවලිය විමසමින් ඒ සඳහා තිබිය යුතු නායකත්ව ලක්ෂණ විග්‍රහ කරයි.

- මෙහෙයවීම - සංවිධානයේ පරමාර්ථ හා අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන්,කළමනාකරුවන් තම තීරණ යථාර්ථයක් බවට පත් කර ගැනීමේදී ඔවුන් සකස් කළ සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන පුද්ගලයන් අවශ්‍ය කටයුතු සඳහා යොමු කිරීමත්,ඔවුන් ධෛර්යවත් කරමින්,ඔවුන්ට සහාය දීමත්,තුළින් ඔවුන්ට බලපෑම් කිරීමේ ක්‍රියාවලියයි.

- මෙහෙයවීමේ ක්‍රියාවලිය ප්‍රධාන කාර්ය තුනකින් සමන්විත වේ.
  1.නායකත්වය
  2.අභිප්‍රේරණය
  3.සන්නිවේදනය

<u>**අභ්‍යාස**</u>

1.සංවිධානයකට නායකත්වයේ අවශ්‍යතාවය පහදන්න.
2.නායකයෙකු හා කළමනාකරුවෙකු අතර ඇති වෙනස්කම් මොනවාද?
3.නායකයා කටයුතු කරන ආකාරය අනුව නායකත්ව ශෛලි වර්ග කර ඒවා පැහැදිලි කරන්න.
4.නායකයාගේ චර්යාත්මක රටාව අනුව නායකත්ව ශෛලි වර්ග කර ඒවා පැහැදිලි කරන්න.
5.අවස්ථානුකූල නායකත්වය යනු කුමක්ද?
6.සාර්ථක නායකයෙකු තුළ තිබිය යුතු නායකත්ව ගුණාංග මොනවාද?